**ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2022**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 29 (ආ) හා 21 (ඊ) ප්‍රකාරව රු.12,302,509,267 ක් වූ කෙටිකාලීන ආයෝජන තුළ ඇතුලත් රු.11,930,031 ක් වටිනා එක්සත් ජනපද ඩොලර්වලින් පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු හා රුපියල්වලින් පවත්වා ගෙන යනු ලබන එකතුව රු.363,478,006 ක් වටිනා ස්ථාවර තැන්පතු ද, රු.1,157,534,667 ක් වූ මුදල් හා මුදල්වලට සමාන දෑ තුල ඇතුලත් රු.1,064,103,259 ක් වූ එක්සත් ජනපද ඩොලර් ඉතුරුම් ගිණුම් හා රු.93,431,408 ක් වූ රුපියල් ඉතුරුම් ගිණුම්ද පැවති නමුත් ඒ සඳහා විස්තරාත්මක සටහන් මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කර නොතිබුණි. | කෙටිකාලීන ආයෝජන හා බැංකු ගිණුම්වල සැලකිය යුතු ශේෂයන් පවත්වාගෙන යන බැවින් එකී ගිණුම් අංකයන් ප්‍රසිද්ධ කිරීමෙන් රහස්‍යභාවය පිළිබඳ අනවශ්‍ය අවදානමක් ඇතිවන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 48 වගන්තියට පටහැනිව රු.141,420,431 ක් වූ ලැබිය යුතු අත්තිකාරම් තුල ඇතුලත්ව තිබූ රු. 25,974,068 ක් වූ බැර ශේෂයන් හිලවු කර දක්වා තිබුණි. | වර්ගීකරණ දෝෂයක් නිසා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 63 (ආ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල ශික්ෂණ රෝහල හා මෙට්‍රොපොලිටන් කැම්පස් ආයතනය | සියළුම ආයතනවල මූල්‍ය තත්ත්වය භාවිතා කරන්නන්ගේ පහසුව සඳහා වෙන්වෙන් වශයෙන් | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| පිළිබඳ හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | විස්තරාත්මකව සඳහන්කර තිබුණද විගණන විමසුමේ සඳහන් පරිදි එය ආර්ථික අස්ථිත්වයක් ලෙස කටයුතු සිදු නොකරන බව. | |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 95(ඇ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන සංචිත ලෙස රු.203,978,109 ක් සහ වෙනත් සංචිත රු.191,524,819 ක් පිළිබඳ හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | විගණන විමසුමේ සඳහන් ප්‍රාග්ධන හා වෙනත් සංචිත පිළිබඳ විස්තරාත්මක හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 14, 15 සහ 16 යටතේ දක්වා ඇති බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 150 (ආ) වගන්තිය ප්‍රකාරව කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල ශික්ෂණ රෝහලේ සිදුකරන ලද මෙහෙයුම්වල ස්වභාවය පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ආයතනික තොරතුරු හෙළිදරව් කිරීම යටතේ ඇතුළත් කර ඇති බැවින් විශ්වවිද්‍යාල ශික්ෂණ රෝහලේ සිදු කරන මෙහෙයුම් කටයුතුවල ස්වභාවය විශේෂයෙන් ලිඛිතව සඳහන් කිරීමක් සිදුකර නැති බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 56 වගන්තිය ප්‍රකාරව රු.1,156,517,317 ක මුදල් හා මුදල්වලට සමාන දෑ පිළිබඳ හෙළිදරව් කිරීමක් හා සැසඳීමක් සිදුකර නොතිබුණි. | කෙටිකාලීන ආයෝජන හා බැංකු ගිණුම්වල සැලකිය යුතු ශේෂයන් පවත්වාගෙන යන බැවින් එකී ගිණුම් අංකයන් ප්‍රසිද්ධ කිරීමෙන් රහස්‍යභාවය පිළිබඳ අනවශ්‍ය අවදානමක් ඇති වන බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 05 හි 26(අ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් බැංකු ගිණුම් 03 ක එක්සත් ජනපද ඩොලර් 2,907,306.52 ක් වූ අවසාන ශේෂය අවසාන අනුපාතයට පරිවර්තනය කර නොතිබීම හේතුවෙන් රු.16,286,441 කින් ලාභය අධිගණනය වී තිබූ අතර, ස්ථාවර තැන්පතු ගිණුම් 06 ක එක්සත් ජනපද ඩොලර් 32,619,412 ක් වූ අවසාන ශේෂයන් අවසාන අනුපාතයට පරිවර්තනය කර නොතිබුණි. ඒ අනුව රු.182,730,690 කින් ලාභය අධි ගණනය වී තිබුණි. | විදේශ ව්‍යාවහාර මූල්‍ය අයිතමයන් වර්ෂ අවසාන විදේශ ව්‍යාවහාර මුදල් දෙසැම්බර් 31 වන දින පැවති විකුණුම් හා මිලදී ගැණුම් අනුපාතයන්ගේ සාමාන්‍යය යොදා ගනිමින් පරිවර්තනය කර ඇති බැවින් ලාභය අධි ගණනයන් සිදු වී නොමැති බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 14 වගන්තියෙහි (අ) හා (ආ) ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා විවිධ ආයතනවලින් ආධාර වශයෙන් ලද උපකරණ 91 න් 81 ක්ම භාවිතයට ගන්නා | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| නමුත් එම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. ඉන් අයිතම 10 ක් විගණන දිනවන විටත් ගබඩාව තුල නිශ්කාර්යව පැවතුණි. | | |
| (එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 49 වගන්තිය ප්‍රකාරව දක්ෂිණ මණ්ඩපයේ වාහන 11 කින් රු.5,099,200 ක් වූ වාහන 7 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. වාහන 11 න් වාහන 04 ක් පමණක් ප්‍රත්‍යාගණන කර තිබියදී වාහන 11 හිම ශුද්ධ ධාරණ අගය සැලකිල්ලට ගෙන ප්‍රත්‍යාගණන ලාභය ගණනය කර තිබූ අතර, ඒ අනුව රු.1,568,047 ක බලපෑමක් සංචිතවලට ඇති වී තිබුණි. තවද, විශ්වවිද්‍යාලයේ රු. 74,601,130 ක් වටිනා වාහන 11 ක් ද, 2019 හා 2020 වර්ෂවලදී ගිණුම් ගත කර තිබූ රු.1,500,000 ක් වටිනා යාපනයේ පිහිටි ඉඩම් කැබලි දෙකක් හා මෙට්‍රොපොලිටන් කැම්පස්හි පිරිවැය රු.16,054,366 ක් වූ ගොඩනැගිලි සහ රු.4,279,691 ක් වූ වාහන ප්‍රත්‍යාගණනය කිරීමටද කටයුතු කර නොතිබුණි. තවද ප්‍රත්‍යාගණන වාර්තා තුළ පිරිවැය රු.3,800,000 ක් වටිනා වාහන 03 ක් සඳහා ප්‍රත්‍යාගණිත වටිනාකම් දක්වා නොතිබුණු අතර, ඒ අනුව එම වාහනවල අගයන් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ප්‍රත්‍යාගණනය සඳහා අත්‍යාවශ්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි වූ බැවින් තක්සේරුකරු විසින් උක්ත විගණන විමසුමෙහි සඳහන් වාහන හා ඉඩම් ප්‍රත්‍යාගණනය ඇතුලත්කර නොතිබුණි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඒ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 52 වගන්තියට පටහැනිව රත්මලාන විශ්වවිද්‍යාලයේ වාහන ප්‍රත්‍යාගණනයෙන් පසු ප්‍රත්‍යාගණනය ලාභය ගණනයේදී ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ පෙර වර්ෂයකදී වාහන ප්‍රත්‍යාගණනයෙන් ජනනය වී තිබූ රු. 43,586,522 ක් වූ ප්‍රත්‍යාගණන ලාභය අවස්ථා 02 කදී අඩුකර සමාලෝචිත වර්ෂයේ වාහන ප්‍රත්‍යාගණනයෙන් ජනනය වූ ලාභය ගණනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන සංචිත රු.87,173,044 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි 2.2.4 අනුව තොග ගිණුම් තැබීමේදී පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට අගයකරන බව දක්වා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.101,017,561 ක් වූ වෛද්‍ය සැපයුම් තොගය තුල රු.10,216,967 ක් වටිනා කල් ඉකුත් වී තිබූ තොග පැවති අතර, එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 9 හි 38 වගන්තියට අනුරූප නොවීම නිසා තොගය රු.10,216,967 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූල විය යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලංකා බැංකුවේ ස්වයං මූල්‍ය අරමුදලෙහි බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි රු.2,674,015 ක් වූ හඳුනා නොගත් වියදම් ශේෂයක් පැවතුණු අතර, එම වියදම් අදාළ ලෙජර් ගිණුම්වලට සටහන් නොවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රු.2,674,015 කින් ලාභය වැඩියෙන් දක්වා තිබුණි. | රු. 2,674,015 වූ හඳුනා නොගත් වියදම් ඇමුණුම "අ" හි දැක්වෙන පරිදි නිවැරදිව හඳුනාගෙන අදාළ ගිණුම් කටයුතු සිදු කරන බව. | වියදම් හඳුනාගෙන ගිණුම් වල සටහන් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී රු.3,130,415 ක ලැබිය යුතු මුද්‍රණ ආදායම්වලින් රු.698,598 ක ආදායම 2022 ජනවාරි 07 දින ආයතනයට ලැබී ඇතත්, එම ආදායම ලැබිය යුතු ගිණුමට බැර නොකර නැවතත් ආදායමට බැර කිරීම තුලින් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.698,598 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) අධ්‍යයන කටයුතු සඳහා බඳවා ගන්නා ලද විදේශීය සිසුන්ගෙන් අදාළ ගිවිසුමේ 3(g) ප්‍රකාරව අයකර ගතයුතු ආහාර හා නවාතැන් ගාස්තු සඳහා අයවිය යුතු මුදල් අදාළ මාසය අවසන්වීමට ප්‍රථම අයකරගත යුතු වුවත්, පාඨමාලා 05 කට අදාළ සිසුන් පස් දෙනෙකුගෙන් එක්සත් ජනපද ඩොලර් 7,052.39 ක ප්‍රමාණයක් විගණිත දිනය වූ 2023 අප්‍රේල් මස 30 දිනය වන විටත් අය කර ගැනීමට අපොහොසත් වී තිබූ අතර, මෙම මුදල | ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 7,052.39 ක වටිනාකම තවදුරටත් හඳුනාගත නොහැකි වටිනාකමක් සේ හඳුනාගෙන එම මුදල ගිණුම්වලින් කපා හැරීමට ආරක්ෂක අමාත්‍යාංශයේ මණ්ඩලයක් පත්කර කටයුතු කරමින් පවතින බව. | ලැබිය යුතු ණය ශේෂ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු අතර එම ණය ශේෂ නොපමාව අයකර ගැනීමටද කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල වෙනත් ලැබිය යුතු දෑ යටතේ දක්වා නොතිබුණි. | | |
| (ඈ) 2021 මාර්තු 11 දින සිට 2023 අප්‍රේල් 24 දින දක්වා සපයා තිබුණු නමුත් මුදල් ගෙවා නොතිබූ රු.216,253,061 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතම 09 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෛද්‍ය උපකරණ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල ශික්ෂණ රෝහල විසින් මිලදී ගෙන තිබූ රු.13,589,319 ක් වටිනා ඖෂධ වෙනත් රෝහල් වෙත යවා තිබූ අතර, ඒ සම්බන්ධයෙන් ගිණුම්වල කිසිදු සටහනක් ඇතුලත්කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තොග ආපසු යැවීමේදී ගිණුම් තුළ ඇතුළත් කළ යුතු වීම. |
| (ඊ) ප්‍රවාහන අංශය ලබාදුන් උපලේඛන අනුව විශ්වවිද්‍යාලය සතුව වාහන 69 ක් පැවති නමුත් ප්‍රත්‍යාගණන වාර්තා අනුව ප්‍රත්‍යාගණය සිදුකර තිබුණේ වාහන 55 ක් සඳහා පමණි. එම වාහන 55 අතුරින් වාහන 3 ක් ප්‍රවාහන අංශයෙන් ලබාදුන් උපලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය සඳහා අත්‍යාවශ්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි වූ බැවින් තක්සේරුකරු විසින් උක්ත විගණන විමසුමෙහි සඳහන් වාහන ප්‍රත්‍යාගණනයට ඇතුලත්කර නොතිබුණු අතර. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිත ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනයේ දී සියළුම වාහන ප්‍රත්‍යාගණනය කළ යුතු අතර, උපලේඛන හා ප්‍රත්‍යාගණන වාර්තාවන්හි ඇතුළත් වාහන විස්තර ගැලපිය යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| අත්තිකාරම් | 54,121,219 | 7,726,291 | 53,348,590 | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන ශේෂයන් අනුරූපී වාර්තා සමඟ ගැලපිය යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මුද්‍රණාල අංශයේ සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.2,431,817 ක් වූ ලැබිය යුතු ශේෂයන් වර්ෂ 02 ත් 07 ත් දක්වා කාලයක සිටද, රු. 219,672,408 ක හිඟ පාඨමාලා ගාස්තු ශේෂයක් වසරකට අධික කාලයක සිටද, 2020 වර්ෂයේ රු.26,780,000 ක් හා 2021 වර්ෂයේ රු.18,041,500 ක් වූ පශ්චාත් උපාධි අංශයේ ලැබිය යුතු පාඨමාලා ගාස්තු ද, විගණිත දින වූ 2023 අප්‍රේල් 03 වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නිලධාරීන් ලබා ගෙන තිබූ රු.88,331,021 ක අත්තිකාරම් මාස 01 ත් වර්ෂ 09 ත් අතර, කාලයක් ගතවී තිබූ නමුත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ණයගැති ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.125,941,615 ක ගෙවිය යුතු ශේෂ තුල අවුරුදු 03 ත් 04 ත් අතර, පැරණි එකතුව රු.35,639,977 ක් වූ ණයහිමි ශේෂ පියවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | ණය හිමි ශේෂ පියවීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1988 අංක 27 හා 2007 අංක 50 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක | 2011 වර්ෂයේ සිට කැඩෙට් නිළධරයන් හෝ රජයේ නිළධරයන් නොවන දේශීය හා විදේශීය සිසුන් වෙත මුදල් ගෙවීමේ පදනම මත උපාධි පිරිනැමීම ආරම්භකර තිබුණි. උපාධි පාඨමාලා 31 අතරින් උපාධි පාඨමාලා 11 ක් කැඩෙට් නිළධරයන් නොවන, මුදල් ගෙවීමේ පදනම මත බඳවාගත් | කෙටුම්පත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය 2023.04.21 වන දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව. | 2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තිරණ පරිදි පනත සංශෝධන කාර්යය කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| අභ්‍යාස ආයතන පනත. | සිසුන් සඳහා පමණක් ක්‍රියාත්මකව පැවතුණි. තවද, 2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ශිෂ්‍යයන් බඳවාගැනිම සහ පාලක මණ්ඩලයේ තීරණ වලංගුතාවය යන කරුණු ආවරණය වන ලෙස විශ්ව විද්‍යාලයට ගැලපෙන ලෙස ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත සංශෝධනය කරගන්නා ලෙස දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදීද පනත සංශෝධන කාර්යය අවසන්කර නොතිබුණි. | | |
| (ආ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වන වගන්තිය | සමාලෝචිත වර්ෂය තුලදී ස්ථාවර තැන්පතු 06 ක ආයෝජනය කල එක්සත් ජනපද ඩොලර් 32,619,412 ක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන මෙම මුදල් කෙටි කාලීනව ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර ඇති බව. | මුදල් පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) 2022 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 | (i) මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් අවස්ථා 37 කදී ලබාදී තිබූ රු.7,726,291 ක් වූ අත්තිකාරම් 2022 දෙසැම්බර් 31 දිනවන විට ද පියවා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර, ඒ වන විට දින 10 සිට මාස 06 ක් දක්වා කාලයක් ගතවී තිබුණි. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | (ii) මුදල් රෙගුලාසි 371(2) (අ) වගන්තියට පටහැනිව විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 55 කදී සීමාව ඉක්මවා එකතුව රු.18,777,100 ක අත්තිකාරම් ලබාදීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) මුදල් රෙගුලාසි 110 | හානිපාඩු ලේඛනයක් විශ්වවිද්‍යාලය සතුව නොවීය. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) මුදල් රෙගුලාසි 570 | විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල ඉදිකිරීමට අදාලව රඳවාගෙන තිබුණු කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු. 76,879,769 ක් වූ අතර, එම ව්‍යාපෘතිය අවසන්කර වර්ෂ 05 කට අධික කාලයක් ගතවී ඇතත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර ආදායමට ගැනීමට කටයුතුකර නොතිබුණි. | කඩිනමින් එම මුදල් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඊ)අංකවිඅ/කොආවිවිරෝ/PC/58/2021(04) හා 2021 සැප්තැම්බර් 28 දිනැති විධායක අධ්‍යක්ෂගේ අභ්‍යන්තර චක්‍රලේඛය | රෝහලේ පෞද්ගලික අංශය සඳහා ගෙවීම් ක්‍රමවත් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණයකර ඇතත් ඒ අනුව කටයුතුකර නොතිබුණු අවස්ථා පැවති අතර, ඒ අනුව අතිකාල ගෙවීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය විධිමත්ව ක්‍රියාවට නංවා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී අතිකාල ගෙවීම සඳහා අභ්‍යන්තර පාලනය විධිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව බදු බැඳියාවක් සහිත රාජ්‍ය ව්‍යවසායක් ලෙස විගණිත දින තෙක් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.82,991,812 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 88,166,939 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,175,127 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයෙන් ලබා දී තිබූ පුනරාවර්තන ප්‍රදාන පහළ යාමත්, පුද්ගල වේතන ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම ඉකුත් වසරට සාපේක්ෂව සියයට 13.78 කින් එනම් රු. 1,491,504,592 පහළ ගොස් තිබූ නමුත් ප්‍රධාන ආදායම් මූලාශ්‍රයක් වූ රෝහල් ආදායම ඉකුත් වසරට සාපේක්ෂව සියයට 34.41 කින් ඉහළ ගොස් තිබුණි. ආදයම් අඩු වීම සඳහා විවිධ ආදායම් අඩුවීම හේතු වී තිබූ අතර විවිධ ආදායම් අතරින් හෝටල් ආදායම සියයට 93.32 කින් එනම් රු.19,567,129 කින් පහළ ගොස් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු වියදම ඉකුත් වසරට සාපේක්ෂව සියයට 12.72 කින් එනම් රු.793,708,019 කින් ඉහළ ගොස් තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුද්ගල වේතන, ගිවිසුම් ගත සේවා වියදම හා අනෙකුත් පුනරාවර්තන වියදම ඉහළ යාම හේතු වී තිබූ අතර පිළිවෙලින් එම වැඩිවීම සියයට 15.86, 33.96 හා 60.01 ක් විය. ගිවිසුම් ගත සේවා වියදම් අතුරින් නිල සංග්‍රහ වියදම් සියයට 165.3 කින් එනම් රු.19,058,383 ද, අනෙකුත් පුනරාවර්තන වියදම් අතුරින් සායන වියදම් සියයට 274.60 කින් එනම් රු.65,301,209 කින්, විභාග ගාස්තු වියදම් සියයට 174 කින් එනම් රු.35,881,176 කින්, විවිධ වියදම් සියයට 327.29 කින් එනම් රු.30,282,704 කින් හා ප්‍රකාශන හා සුභසාධන හා ආරක්ෂණ වියදම් සියයට 318.87 කින් එනම් රු.30,966,705 කින් ඉහළ ගොස් තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයේ සියයට 1.86 ක් වූ ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 0.3 ක් දක්වා අඩු වී තිබූ අතර විශ්ව විද්‍යාලයේ ලාභ ඉපයීම තව දුරටත් පහළ මට්ටමක පැවතුණි.

(ආ) ඉකුත් වර්ෂයේ 3.21:1 ක් වූ ජංගම අනුපාතය සමාලොචිත වර්ෂයේදී 2.7:1 ක් දක්වා පිරිහී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී ස්කන්ධය මත ණය අනුපාතය 4.13:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 0.76:1 ක් දක්වා අඩු වී තිබූ නමුත් එම අඩු වීම සඳහා විශ්ව විද්‍යාලයේ ඉඩම්, ගොඩනැගිලි සහ වාහන ප්‍රත්‍යාගණනයෙන් ප්‍රත්‍යාගණන සංචිත ඉහළ යාම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රෝහල විසින් උපයෝජනය කරන ලද විදුලිය වෙනුවෙන් ගෙවිය යුතු විදුලි ගාස්තු නිසි කලට පියවීමට රෝහල් කළමනාකරණය අපොහොසත් වීම හේතුවෙන් 2022 වර්ෂයේ විදුලි බිල්පත් සඳහා රු. 26,143,639 ක දඩ මුදල් ගෙවීමට රෝහලට සිදු වී තිබූ අතර, එම ප්‍රමාණයෙන් රෝහලට පාඩු සිදු වී තිබුණි. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | විදුලි බිල්පත් අප්‍රමාදව පියවීම මඟින් ආයතනයට සිදු වන පාඩු අවම කර ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් හෙක්ටයාර් 21.5815 ක භූමියේ විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහල ස්ථාපිතකර තිබූ අතර, එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විශ්වවිද්‍යාලය වෙත පැවරී නොතිබුණි. එහෙත් එම භූමියෙහි ඉදිකර තිබුණු ශික්ෂණ රෝහලට අයත් | කෙටුම්පතේ සඳහන් කරුණු අනුව විශ්වවිද්‍යාල රෝහල සතුව එක් ගිලන් රථයක් නොව ගිලන්රථ තුනක් පවතින බව. | ඉඩම් අත්පත් කර ගැනීම කඩිනමින් අවසන් කළ යුතු වීම. |

ගොඩනැගිලිවල වටිනාකම රු.45,385,484,229 ක් වූ අතර, භූමිය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.1,216,884,293 ක පිරිවැයක්ද දරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට ඉදිකිරීම් අවසන්කර වර්ෂ 06 කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම අත්පත්කර ගැනීමේ කාර්යයන් අවසන්කර නොතිබුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල ශික්ෂණ රෝහල හා සිසුන් අතර, ඇති ගිවිසුමෙහි 6 (a) හා (b) වගන්තියට පටහැනිව විශ්වවිද්‍යාලයේ සිසුන් හා කාර්ය මණ්ඩලයේ 125 දෙනෙකු එම සේවය අතහැර ගොස් තිබුණි. තවද මීට අදාළව 1998/99 අධ්‍යන වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.83,928,395 ක් වටිනා බැඳුම්කර අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | ගිවිසුම් අනුව කටයුතු නොකරන සිසුන් ගෙන් බැඳුම්කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 201,629,000 ක ණය මුදලක් ලබාදී තිබුණි. එම ණය මුදලෙන් එක්සත් ජනපද ඩොලර් 180,143,872.11 ක මුදලක් වියදම්කර තිබූ අතර, ඉන් වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට වෙන්කර තිබූ එක්සත් ජනපද ඩොලර් 21,485,127.81 මුදලක් එනම් රු.7,467,476,280 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | අරමුදල් කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.161,624,484 ක් වැයකර මිලදී ගෙන තිබූ වෛද්‍ය උපකරණ ගබඩාව තුල නිශ්කාර්යව රඳවාගෙන තිබුණි. තවද, 2022 මැයි මස සිට ශික්ෂණ රෝහලේ වාට්ටු අංක 07 සහ දැඩිසත්කාර ඒකක 03 ක් භාවිතයට ගැනීම නතර කර තිබූ බැවින්, එම වාට්ටු තුල පැවති රු.212,456,698 ක් වටිනා අයිතම වසරකට අධික කාලයක් නිශ්කාර්යව පැවතුණි. ඒ අනුව නිශ්කාර්යව පැවති මුළු වත්කම්හි වටිනාකම රු. 374,081,182 ක් විය. | වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කටයුතු සිදුකිරීම් කරනු ලබන අවස්ථාවන්හිදී හා නැවත වෛද්‍යවරයෙක් බඳවා ගැනීම් කටයුතු සිදු කල විට මෙම උපකරණ ප්‍රයෝජනයට ගන්නා බව. | මිලදී ගන්නා වෛද්‍ය උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ආ) 2018 වර්ෂයේදී කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහල ඉදිකිරීමේදී අංශ 56 කට අදාළව රසායනාගාර පරීක්ෂණ ද්‍රව්‍යයන් හා වාර්තාවන් ප්‍රවාහනය කිරීමේ අරමුණින් එක්සත් ජනපද ඩොලර් 530,000 වැය කරමින් වායු නල පද්ධතියක් (Pneumatic Tube System) ස්ථාපිත කර තිබුණි. නමුත් 2022 වර්ෂය සඳහා භාවිතා කර තිබුණේ අංශ 56 න් අංශ 47 ක් සඳහා පමණක් වුවත් එයිනුත් අංශ 24 ක් සඳහා දත්ත ප්‍රවාහනයට යොදාගෙන තිබුණේ 2 ත් 100 ත් අතර අඩු දත්ත ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය. | දැනට මෙම පද්ධතියෙහි නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා අත්‍යවශ්‍යව පවතින මාදුකාංග හා පළපුරුදු (Skillfull) කාර්ය මණ්ඩලය නොමැති බැවින් මෙම පද්ධතියේ මනා ක්‍රියාකාරිත්වය හා පැවැත්ම සඳහා ඉදිරි නඩත්තු කටයුතු එම දේශීය නියෝජිත ආයතනය හා සම්බන්ධීකරණය වී එම කාර්යය කරගත යුතුව පවතින බව. | වායු නළ පද්ධතිය උපරිම ධාරිතාවයෙන් රෝහල් කටයුතු සඳහා භාවිතයට ගත යුතු වීම. |

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 ජනවාරි 24 දින ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හා Amrita Technologies සහ Thinkcube Systems සමාගම සමඟ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහලේ එක්සත් ජනපද ඩොලර් 1,300,334.21 වැය කරමින් සෞඛ්‍ය තොරතුරු | මූලිකව ගෙවීම් සිදු කිරීමට ඇති වූ ප්‍රමාදය ව්‍යාපෘතිය කරගෙන යාමට සැලසුම් කළ කාල සීමාවට වඩා පසුපස වීමට බලපෑ ඇති අතර එම ප්‍රමාදය ව්‍යාපෘතිය පුරාවටම තවමත් බලපා ඇති බව. | සැලසුම් කල පරිදි පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. |

කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ත්‍රිපාර්ශවීය ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව මෙම පද්ධතිය 2023 පෙබරවාරි 24 දින නිම කිරීමට බලාපොරොත්තු වුවද, විගණන දිනය වන 2023 මැයි 31 දින වන විටත් මෙම පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යය නිම කර නොතිබුණි.

### 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ සිමෙන්ති මළු 1120 ක් රු.2,982,011 කට මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයන් කොටස් 03 කට වෙන්කර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම නිසා අදාළ සැපයුමේ මුළු වටිනාකම මත, මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට අනුව ප්‍රධාන ටෙන්ඩර් මණ්ඩයක් වෙත ඉදිරිපත් කිරීම මඟ හැරී තිබුණි. තවද මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10, 5.3.11 හා 8.9.1 වගන්තිවලට අනුව මෙම මිලදී ගැනීම් වෙනුවෙන් පිළිවෙලින් කාර්යසාධන සුරක්ෂණයක් සහ ලංසු සුරක්ෂණයක් ලබා ගැනීම හා විධිමත් ගිවිසුමකට එළඹීම යන අවශ්‍යතා ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | ලංසු ලබා ගැනීමේ අර්බුධකාරී තත්වය මත කාර්යසාධන සුරක්ෂණය, ලංසු සුරක්ෂණය ලබාදීම හා ගිවිසුම් ගතවීමද සිදු කර ගැනීමට නොහැකි වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) අංක 01-41/2019 හා 2019.07.22 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව හදිසි වෛද්‍ය සැපයුම් මිලදීගැනීම් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල්වලින් පමණක් සිදුකල යුතු බවද, එහි එම ඖෂධ නොමැතිනම් ඒ බව ලිඛිත තහවුරුකර ගැනීමක් ලබාගැනීමෙන් පසු පමණක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව මිලදී ගතයුතු බව දක්වා තිබුණද, විගණන නියැදි පරීක්ෂණයට අනුව වටිනාකම රු. 3,053,808 ක් වූ ඖෂධ මිලදී ගැනීමේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල්වල පවතී ද යන්නට ලිඛිත තහවුරු කිරීම් ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |